ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ

**ප්‍රවෘත්ති නිවේදනය**

මහජන කටයුතු අංශය
දුරකථන: +94 (11) 249-8100 ● ෆැක්ස්: +94 (11) 244-9070
විද්‍යුත් තැපැල: VanHornNT@state.gov ●වෙබ්: http://lk.usembassy.gov

නිවේදන අංක: 20210412

**සංස්කෘතික සංරක්ෂණය සඳහා වන එ.ජ. තානාපති අරමුදල 20 වසරක් තිස්සේ අනර්ඝ හා විවිධ වූ ශ්‍රී ලාංකීය උරුමය රැකගැනීම සමරයි**

2021 අප්‍රේල් 12 වැනි දින, කොළඹ දී: ශ්‍රී ලංකාවේ විවිධ වූ සංස්කෘතික වත්කම් ආරක්ෂා කරදීම සඳහා රුපියල් මිලියන 200කට වඩා (ඩොලර් මිලියන 1) අරමුදල් වශයෙන් ලබා දී ඇති, එ.ජ. රාජ්‍ය දෙපාර්තමේන්තුවේ සංස්කෘතික සංරක්ෂණය සඳහා වන තානාපති අරමුදලේ (Ambassadors Fund for Cultural Preservation (AFCP)) 20 වැනි වර්ෂ සංවත්සරය මේ මාසයට යෙදී ඇත.

2001 පටන් මේ දක්වා, AFCP මගින් ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති 13ක් සඳහා අරමුදල් සපයා තිබේ. අනුරාධපුර සහ ගාල්ල ලෝක උරුම ස්ථානවල බටහිර ආරාම සහ ඓතිහාසික ගොඩනැගිලි විස්තීර්ණ ලෙස ලේඛනගත කිරීම, මඩකලපුව ලන්දේසි කොටුව ප්‍රතිසංස්කරණය සහ දෙමළ පුරාවස්තු සංරක්ෂණය සඳහා පුරාවිද්‍යා කෞතුකාගාර විද්‍යාගාරයක් ඇති කිරීම ඒ ව්‍යාපෘති අතරට ඇතුළත් වේ. ඇතැම් ශ්‍රී ලාංකීය සම්ප්‍රදායන් ගොඩනැගිල්ලක් තුළින් සමු නොවන බව පිළිගනිමින් AFCP හරහා ආදිවාසි, දෙමළ සහ බෞද්ධ ප්‍රජාවන්ගේ චාරිත්‍රානුකූල සංගීතය සහ නර්තනය යන ස්පර්ශ කළ නොහකි උරුමය සංරක්ෂණය සඳහා ද සහය ලබා දී තිබේ. සියළුම AFCP ව්‍යාපෘතීන් සඳහා විද්වත් දැනුමැති දේශීය හවුල්කරුවන් සම්බන්ධ වන අතර සාම්ප්‍රදායික අමුද්‍රව්‍ය සහ ක්‍රමවේද භාවිතය එහිදී සැමවිට ප්‍රවර්ධනය කෙරේ. මෙම වැඩසටහන් හරහා සිවිල් සමාජය ශක්තිමත් වන අතර ආර්ථික වර්ධනය සඳහා පෙළඹවීමත් සංස්කෘතික විවිධත්වයට ගරුකිරීම පෝෂණය කිරීමත් සිදු වේ.

"ශ්‍රී ලංකාව පුරා සැරිසරමින් AFCP මගින් ආරක්ෂා කරදීමට උපකාර කළ ඇතැම් ව්‍යාපෘති බැලීමට යාමේදී, විවිධ ජනවර්ග සහ ආගම් සඳහා නිවහනක් වශයෙන් මෙරටට ඇති දීර්ඝ ඉතිහාසය පැහැදිලි වනවා" යනුවෙන් එ.ජ. තානාපතිනි ඇලෙයිනා බී. ටෙප්ලිට්ස් මහත්මිය පැවසුවාය. "ශ්‍රී ලාංකිකයින්ට තමන්ගේ උරුමය සැමරීමට උදවු කිරීමටත් අනාගත පරම්පරාවලට අගය කිරීමට හා ගවේෂණය කිරීමට එය සංරක්ෂණය කිරීමටත් එක්සත් ජනපදය උපකාර කිරීම පිළිබඳ මම ආඩම්බර වනවා."

2004 සුනාමි ආපදාවෙන් බලපෑමට ලක් වූ මාතර ලන්දේසි කොටුව අභ්‍යන්තරයෙහි ඇති සංස්කෘතිකමය දේපළ පිළිබඳ සමීක්ෂණයක් කරමින්, AFCP හි එක් පළමු මහා පරිමාණ ව්‍යාපෘතියක් 2005 දී ආරම්භ විය. මෙම සවිස්තරාත්මක සමීක්ෂණයට මිම්මට අඳින ලද රූප සටහන්, ඡායාරූප, චිත්‍ර සහ සුනාමි උවදුරෙන් සිදුවූ හානිය විස්තර කරන විස්තීර්ණ ගොඩනැගිලි සමීක්ෂණයක් ද ඇතුළත් විය.

මෑතකාලීනව, ප්‍රතිසංස්කරණය කළ අනුරාධපුරයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කෞතුකාගාරය 2019 සැප්තැම්බර් මාසයේ දී ටෙප්ලිට්ස් තානාපතිතුමිය අතින් විවෘත විය. දශකයක කාලයක් පැවති මෙම කෞතුකාගාර ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියට එහි පුරාවස්තු එකතුවට වඩාත් උසස් සංරක්ෂණ ශිල්පක්‍රම සහ උපකරණ ඇතුළත් වූ අතර, ප්‍රදර්ශන පෙට්ටි සහ ආරක්ෂාව, කෞතුකාගාරයේ පුරාවස්තු එකතුව නාමාවලිගත කිරීම සහ සංරක්ෂණය, සහ පුරාවස්තු සංරක්ෂණය සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය පුහුණු කිරීම යන කටයුතු සඳහා AFCP විසින් වෙන වෙනම ලබාදුන් ප්‍රදාන තුනක් හරහා අරමුදල් සම්පාදනය කෙරිනි.

රජගල බෞද්ධ ආරණ්‍යයට අයත් ගුහා වාසස්ථාන, ස්මාරක සහ ගොඩනැගිලි සංරක්ෂණය සහ ප්‍රතිසංස්කරණය අනෙකුත් ව්‍යාපෘති අතරට ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතියෙන් ස්තූප අතර ගමන් කිරීමට ඇති මාර්ග, පොදු ගොඩනැගිලි, භාවනා චිත්‍ර සහිත ගුහා, සහ අනෙකුත් වැදගත් ව්‍යුහ ප්‍රතිසංස්කරණය කරන ලදී. ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ සිදුකළ එවැනි පළමු පර්යේෂණ කැණීම මෙම ස්ථානයේ සිදුකරන ලද අතර එහිදී ප්‍රාග් ඓතිහාසික ජනාවාසයක් හඳුනාගැනීමට හැකි විය.

කොංග්‍රස් මණ්ඩලයේ ඉල්ලීම මත රාජ්‍ය දෙපාර්තමේන්තුවෙන් ඇතිකරන ලද ප්‍රදාන වැඩසටහනක් වන AFCP හරහා 2001 පටන් ශ්‍රී ලංකාව ද ඇතුළුව රටවල් 130ක සංස්කෘතික සංරක්ෂණ ව්‍යාපෘති 1,000ක් ඉක්මවූ සංඛ්‍යාවක් සඳහා සහය ලබා දී තිබේ. AFCP මගින් සහය ලබාදුන් ව්‍යාපෘති 13 සම්බන්ධයෙන් වැඩි විස්තර පහත දැක්වෙන තොරතුරු පත්‍රිකාවට ඇතුළත් කර තිබේ.

**කරුණු පත්‍රිකාව: ශ්‍රී ලංකාවේ AFCP ව්‍යාපෘතිවල ඉතිහාසය**

එක්සත් ජනපදය 2005 සිට ශ්‍රී ලංකා රජය සහ පෞද්ගලික අංශයේ ආයතන සමගින් හවුල්කාරීත්වයෙන් ශ්‍රී ලංකාවේ සංස්කෘතික සංරක්ෂණ ව්‍යාපෘති සඳහා සහයදීම පිණිස ඇ. ඩොලර් 1,040,000 ඉක්මවන මුදලක් වියදම් කර තිබේ. මෙම දේශීය හවුල්කරුවන් එක් එක් ව්‍යාපෘතියට තාක්ෂණික සහ සංස්කෘතික විශේෂඥ දැනුම ගෙන එන අතර ශ්‍රී ලංකාවේ උරුමය අර්ථවත් අන්දමින් සංරක්ෂණය කෙරෙන බව සහතික කරගැනීමට ඔවුහු උදවු වෙති.

- 2005: සුනාමි ආපදාවෙන් බලපෑමට ලක් වූ, මාතර ලන්දේසි කොටුව අභ්‍යන්තරයේ සංස්කෘතික දේපළ සම්බන්ධයෙන් සිදුකළ සිවුමස් සමීක්ෂණයට ප්‍රදේශයේ ඉතිහාසය සමීක්ෂණය කිරීම, ගොඩනැගිලිවලට වූ හානිය හා තනි ගොඩනැගිලි සංරක්ෂණය සඳහා නිර්දේශ, සහ ස්මාරක හා ස්ථාන පිළිබඳ ජාත්‍යන්තර කවුන්සිලයෙන් පොදුවේ නාගරික සංරක්ෂණය සඳහා ලබාදුන් සැලසුම ඇතුළත් විය.

- 2007: යුනෙස්කෝ-ශ්‍රී ලංකා සංස්කෘතික ත්‍රිකෝණ වැඩසටහනට සම්බන්ධව අනුරාධපුරයේ යුනෙස්කෝ ලෝක උරුම ස්ථානයේ ඇති විහාර ආරාම ලේඛනගත කිරීම.
- 2008: ශ්‍රී ලංකා රාජ්‍ය චිත්‍රපට ඒකකය සමග හවුල්කාරීත්වයෙන් නිදහස ලැබූ අවධියේ වාර්තාමය චිත්‍රපට සහ වෘතාන්ත චිත්‍රපට සංරක්ෂණය, විවිධ ජනවර්ග නියෝජනය කරන චිත්‍රපට දීර්ඝ කාලීන සංරක්ෂණය උදෙසා ඩිවීඩී තැටිවලට මාරු කිරීම.
- 2009: අනුරාධපුර සහ යටාල කෞතුකාගාර එකතු සඳහා මාර්ගගත ඉන්වෙන්ටරියක් සහ නාමාවලියක් නිර්මාණය කර ප්‍රකාශනය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමග හවුල්කාරීත්වයෙන්, වසර සියයකට අධික කාලයක් තිස්සේ කැණීම් හරහා සොයාගත් ද්‍රව්‍ය සංරක්ෂණය.
- 2011: ශ්‍රී ලංකා නගර සැලසුම් ආයතනයේ හවුල්කාරීත්වය ඇතිව මඩකලපුවේ ලන්දේසි කොටුව සමීක්ෂණය කිරීම, ලේඛනගත කිරීම, සහ සංරක්ෂණය සඳහා ඉදිකිරීම් සිදුකිරීම.
- 2011: ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමග හවුල්කාරීත්වයෙන් යුනෙස්කෝ ලෝක උරුමයක් වන ගාල්ලේ ලන්දේසි කොටුව තුළ ඇති ඓතිහාසික ගොඩනැගිලි විස්තීර්ණ ලෙස ලේඛනගත කිරීම, එම එක් එක් ගොඩනැගිල්ල සඳහා සංරක්ෂණ සැලසුමක් නිර්මාණය.
- 2012: කෞතුකාගාරවල උපකරණ ඇගැයුම් කිරීම සහ පුහුණු ලබාදීම ඇතුළුව, ලෝක උරුම ස්ථානවල සහ ජාතික කෞතුකාගාරවල පුරාවස්තු සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමගින් සහයෝගයෙන් ක්‍රියා කිරීම
- 2013: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ සී/ස පාරිසරික සැලසුම් සේවා ආයතනය සමග මඩකලපුවේ ලන්දේසි කොටුවේ බී ගොඩනැගිල්ල සංරක්ෂණය සහ මඩකලපුවේ බහු-වාර්ගික හා බහු-ආගමික ප්‍රජාව සඳහා සංස්කෘතික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයක් ඇතිකිරීම.
- 2013: ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමගින්, අම්පාර දිස්ත්‍රික්කයේ රජගල බෞද්ධ ආරාම පුරාවිද්‍යා රක්ෂිතය තුළ ඇති ඉපැරණි ස්මාරක විස්තීර්ණ ලෙස සංරක්ෂණය කිරීම. මෙම වනගත ආරණ්‍ය ශ්‍රී ලංකාවේ ඇති විරළ, පුරාවිද්‍යාත්මක ක්‍රියාවලීන්ට භාජනය නොවී යුද්ධය හේතුවෙන් තිස්වසරක් පමණ නොසලකා හැර තිබූ සුවිශේෂී ස්ථානයකි.
- 2015: ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්යාලය සමගින් රජගල බෞද්ධ ආරණ්‍යයට අයත් ගුහා වාසස්ථාන, පිළිම සහ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය.
- 2015: පුරාවිද්‍යාත්මක පුරාවස්තු සම්බන්ධයෙන් නිවාරණාත්මක සංරක්ෂණ ක්‍රියාමාර්ග යොදාගැනීමේ අරමුණ ඇතිව අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ ඇති බෞද්ධ, හින්දු සහ අනෙකුත් පුරාවස්තු එකතුන් සංරක්ෂණය සඳහා ප්‍රදර්ශක ආවරණ ලබාදීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමගින් තවදුරටත් සහයෝගයෙන් කටයුතු කිරීම.
- 2016: ආදිවාසී, දෙමළ හින්දු, සහ බෞද්ධ ප්‍රජාවන්ගේ වියැකී යන සාම්ප්‍රදායික සහ දේශීය චාරිත්‍රානුකූල සංගීතය, නර්තන,සහ ඒ හා සම්බන්ධ කලා ශිල්ප හතරක් සංරක්ෂණය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමගින් හවුල්කාරීත්වයෙන් කටයුතු කිරීම.

- 2018: දෙමළ පුරාවස්තු රැකගැනීම හා සංරක්ෂණය සඳහා යාපනය විශ්වවිද්‍යාලය සමගින් හවුල්කාරීත්වයෙන් පුරාවිද්‍යා කෞතුකාගාර විද්‍යාගාරයක් ඇතිකිරීම.